# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த முன்னேற்ற அறிக்கை

# Annual Performance Report

# 2014



**පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය**

**கால்நடைவள மற்றும் கிராமிய சமூக அபிவிருத்தி அமைச்சு**

**Ministry of Livestock and Rural Community Development**

පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2014

# පටුන


1 හැඳින්වීම

2 පසුබිම

2.1 ග්‍රාමීය අංශය

3 ග්‍රාමීය ප්‍රජා සංවර්ධනය

3.1 පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය

3.2 ග්‍රාමීය ප්‍රදේශවල ජීවනෝපාය හා මූලික පහසුකම් වැඩිදියුණු කිරීම

3.3 වතු අංශයේ නිවාස වැඩසටහන

3.4 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය ප්‍රජා සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතිවල ප්‍රගතිය

4 අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි ප්‍රගතිය

4.1 වැවිලි මානව සංවර්ධන භාරය

# පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

## දර්ශනය

පශු සම්පතින් ස්වයංපෝෂිත වීම සහ ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම.

## මෙහෙවර

පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා යන දෙඅංශයන් හි තිරසාර සංවර්ධනයක් උදෙසා පවතින සම්පත් උපරිම අයුරින් කළමනාකරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

## අමාත්‍යාංශයේ ඉලක්ක:

- පශු සම්පත් සංවර්ධනය තුළින් තිරසාර සහ සමානාත්මක ආර්ථික හා සාමාජීය ප්‍රතිලාභ සත්ව පාලන ගොවීන්ට ලබාදීම.
- දේශීය පශු සම්පත් නිෂ්පාදන සුළභ කිරීම තුළින් තරගකාරී මිලකට එම නිෂ්පාදන පාරිභෝගික ප්‍රජාව වෙත ලබාදීම.
- වසර 2016 වන විට දේශීය කිරි අවශ්‍යතාවය දේශීය නිෂ්පාදනය තුළින් ලගා කර ගැනීම.
- වසර 2016 වන විට වර්තමාන කුකුළු නිෂ්පාදන ප්‍රමාණය දෙගුණ කිරීම.
- **පසුබෑමට ලක්වූ ප්‍රදේශවල ග්‍රාමීය ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වයන් නගා සිටුවීම.**
- **මූලික පහසුකම් හා ජීවනෝපාය මාර්ග සංවර්ධනය මගින් ග්‍රාමීය ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම.**
- **ප්‍රජා මූලික සංවිධාන සවිමත් කිරීම මගින් ග්‍රාමීය ප්‍රජාව බලගැන්වීම.**
- **ග්‍රාමීය ප්‍රජාව ආශ්‍රිත අධ්‍යාපනික, වෘත්තිය පුහුණු, ආගමික, ක්‍රීඩා හා සංස්කෘතික ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම.**

## පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

1. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
2. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
3. මිල්කෝ (පුද්ගලික) සමාගම
4. සී./ස. ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම
5. සී/ස මහවැලි පශු සම්පත් ව්‍යාපාරික සමාගම
6. සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම
7. **වැවලි මානව සංවර්ධන භාරය ****

** (වැවිලි ප්‍රදේශවල ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන් හා ව්‍යාපෘතිවල ප්‍රගතිය සහ මේ වන විට වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතට ගැනෙන වැවිලි මානව සංවර්ධන භාරයේ කාර්ය සාධනය පමණක් "2014 ප්‍රගති වාර්තාව" යටතේ විස්තර කෙරේ).

# 1. හැඳින්වීම

පසුගාමී ප්‍රදේශවල වෙසෙන ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ සහ පශු නිෂ්පාදනවලින් රට ස්වයංපෝෂිත කිරීමේ දැක්ම පෙරදැරිව පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය ස්ථාපනය කරනු ලැබ ඇත.

පහත දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර දෙක යටතේ අමාත්‍යාංශයේ වැඩසටහන් හා ව්‍යාපෘතිවල සංවර්ධනය පෙළගස්වා ඇත.

1. පශු සම්පත් සංවර්ධනය
2. ග්‍රාමීය ප්‍රජා සංවර්ධනය

2015 වසරේ නව රජය ස්ථාපිතවීමෙන් පසුව එවකට පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ බලය පවරා තිබූ පශු සම්පත් හා ප්‍රජා සංවර්ධන වැඩසටහන් ඇතුළු පහත දැකවෙන ආයතන, සමාජ සේවා, ශුභසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ගැසට් කරනු ලැබ ඇත.

1. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
2. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
3. මිල්කෝ (පුද්ගලික) සමාගම
4. සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම
5. සී/ස මහවැලි පශු සම්පත් ව්‍යාපාරික සමාගම
6. සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම

එවකට පැවති පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ බලය පවරනු ලැබ, වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ගැසට් කරන ලද එකම ආයතනය වූයේ වැවිලි මානව සංවර්ධන භාරය පමණි.

වැවිලි ක්ෂේත්‍රයෙහි වෙසෙන ග්‍රාමීය ජනතාවගේ සමාජ ආර්ථික මට්ටම වැඩි දියුණු කිරීම පිණිස වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය බලගන්වනු ලැබ ඇති හෙයින්, "2014 කාර්යසාධන වාර්තාව" මගින් සාකච්ඡා කෙරෙනුයේ, වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ බලසීමාවට ගැනෙන, වැවිලි අංශය තුළ වෙසෙන ග්‍රාමීය ජනතාව විෂයයෙහි ක්‍රියාවට නංවා ඇති සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතිවල ප්‍රගතිය සහ ප්‍රාදේශීය කාර්යාල 7 කින් ක්‍රියාත්මක වන වැවිලි මානව සංවර්ධන භාරය ආශ්‍රිත ප්‍රගතිය පමණි.

# 2. පසුබිම

## 2.1 ග්‍රාමීය අංශය

දළ දේශීය නිෂ්පාදිතය සඳහා ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාව ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරනු ලබන හෙයින් ඔවුන් ආර්ථිකයෙහි වැදගත් අංශයක් බවට පත්ව තිබේ. ග්‍රාමීය අංශය තුළ දළ වශයෙන් මිලියන 16 ක පමණ ජනතාවක් වෙසෙතැයි ගණන් බලා ඇති අතර, ඉන් දස ලක්ෂයකට ආසන්න පිරිසක් වතු අංශය ආශ්‍රිතව ජීවත් වේ.

ශ්‍රී ලංකාවේ ජාතික දරිද්‍රතා ප්‍රතිශතය 2007 වසරේදී සියයට 15.2 ක් වූ අතර, 2010 දී එය සියයට 8.9 ක් විය. නාගරික, ග්‍රාමීය හා වතු යන අංශයන්හි 2007 වර්ෂයේදී මෙම ප්‍රතිශතය පිළිවෙලින් සියයට 6.7, 15.7 හා 32.0 ක් වූ අතර, ඒවා අතර පැහැදිලි වෙනසක් දැකිය හැකි විය. 2012 / 2013 කාල පරිච්ඡේදය තුළ වතු අංශය විෂයයෙහි දරිද්‍රතා ඒක ශීර්ෂ අනුපාතය සියයට 10.9 ක් වූ අතර, එම අංශයේ ගෘහ ඒකක ප්‍රමාණයෙන් සියයට 8.8 ක ජනතාවක් නිල දරිද්‍රතා රේඛාවට වඩා පහල මට්ටමක පසු විය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2012/2013 කාල පරිච්ඡේදය සඳහන් වූ සාමාන්‍ය හා මධ්‍යම ගෘහ ඒකක ආදායම් ගණනය අනුව, වතු අංශය තුළ ගෘහ ඒකකයක සාමාන්‍ය ආදායම රු: 30,220.00 ක් වූ අතර, එම ප්‍රමාණය ආර්ථිකයේ ග්‍රාමීය හා නාගරික අංශවලට වඩා අඩු අගයක් ගනී. මීට අමතරව වතු අංශයේ සාමාන්‍ය ඒක පුද්ගල ආදායම, ජාතික සාමාන්‍ය ඒක පුද්ගල මාසික ආදායමෙන් සියයට 65 ක ප්‍රමාණයක් ගනී.

භූගෝලීය වශයෙන් පවත්නා සංවර්ධනයේ අසමතුලිත ව්‍යාප්තිය වටහාගත් රජය, පසුගාමී ප්‍රදේශ සංවර්ධනය කිරීමෙහිලා ඉහළ ප්‍රමුඛතාවක් ලබාදී ඇත. ඒ අනුව, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් පසුගාමී ප්‍රදේශයන්හි ජීවත්වන ජනතාවගේ විශේෂයෙන් රටේ වැවිලි අංශයට අයත් ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම හා සංවර්ධනය උදෙසා වූ වැඩ සටහන් ක්‍රියාවට නංවා ඇත. වැවිලි අංශයේ සේවක සේවිකාවන්ගේ මානව හා සමාජ සංවර්ධනය ආශ්‍රිත කර්තව්‍යයන් පැවරී ඇති වැවිලි මානව සංවර්ධන භාරය සහ ප්‍රජාවගේ ආගමික, අධ්‍යාපනික, වෘත්තීය, සෞන්දර්යාත්මක, සමාජීය හා ආර්ථික සංවර්ධනය කෙරෙහි යොමු වූ සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ග්‍රාමීය ප්‍රජා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන ආයතන වේ.

# 3. ග්‍රාමීය ප්‍රජා සංවර්ධනය

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අංශයට අයත් මූලික වගකීම වනුයේ පසුගාමී ප්‍රදේශවල වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමත්, මූලික පහසුකම් වැඩි දියුණු කර ඔවුන්ගේ මූලික අවශ්‍යතා ඉටුකර දීමත් සඳහා කටයුතු කිරීමයි. ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අංශය වෙත පැවරී ඇති ප්‍රමුඛ කාර්ය භාරය වන්නේ ජාතික ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත්කර ගැනීමේ අරමුණින් යුතුව වැඩසටහන් මගින් ආවරණය නොවූ මූලික පහසුකම් සැලසීම සඳහාත්, තරුණ තරුණියන් සවි බල ගැන්වීම සඳහාත්, සංස්කෘතික හා ආගමික සංහිඳියාව මෙන්ම සමාජ සුභසාධනය ඇති කිරීම සඳහාත් විශේෂ අවධානයක් යොමු කිරීමයි.

2014 වර්ෂය ආරම්භයේදී ග්‍රාමීය ප්‍රජා සංවර්ධනය සඳහා වෙන්කරන ලද මුළු ප්‍රතිපාදනය රු.මි. 881.5 ක් විය. මේ සඳහා වෙන්කළ අතිරේක ප්‍රතිපාදන හේතුවෙන් මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 949.5 දක්වා පසුව ඉහළ ගොස් ඇත. 2014 වසර අවසානය වන විට මෙම මුදලින් රු.මි. 876.73 ක මුදල් ප්‍රමාණයක් වැය කරනු ලැබ තිබේ. මෙම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති අමාත්‍යාංශ විෂය පථය යටතේ පවත්නා සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම හා වැවිලි මානව සංවර්ධන භාරය මගින්ද, පළාත් සභා පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ද ක්‍රියාත්මක කෙරේ. මෙබඳු මැදිහත්වීම් තුළින් පසුගාමී ප්‍රදේශවල වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීමට අමාත්‍යාංශයට හැකි වී තිබේ.

**මෙම අංශය යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් තුනකි.**

1. පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය
2. ග්‍රාමීය ප්‍රදේශවල ජීවනෝපාය හා මූලික පහසුකම් වැඩිදියුණු කිරීම
3. වතු නිවාස වැඩ සටහන

මෙම වැඩසටහන් යටතේ ග්‍රාමීය හා වතු අංශයේ වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම උදෙසා අමාත්‍යාංශයේ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අංශය පහත දැක්වෙන සංවර්ධන කාර්යයන් ඉටු කිරීමට කටයුතු කර ඇත.

## 3.1 පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය (යටිතල පහසුකම් සංවර්ධනය)

ග්‍රමීය හා වතු අංශය තුළ දරිද්‍රතාවය ඉහළ මට්ටමක පැවතීමට ප්‍රධානතම හේතුව වනුයේ සමාජ ආර්ථික සංවර්ධනය සහ අනෙකුත් යටිතල පහසුකම් අසතුටුදායක මට්ටමක පැවතීමයි. එහෙයින් දරිද්‍රතාවය අවම කිරීමේ අරමුණ පෙරදැරිව මාර්ග පද්ධති සංවර්ධනය කිරීම, ප්‍රවේශ මාර්ග ඉදිකිරීම, නිවාස නැවත සෙවිලි කිරීම සහ සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් සම්පූර්ණ කිරීම වැනි කටයුතු ද, ප්‍රජා මධ්‍යස්ථාන ඉදිකිරීම්, පරිගණක මධ්‍යස්ථාන (E-kiosk) වැඩිදියුණු කිරීම හා සුබසාධක සමිතිවලට උපකරණ සපයාදීම වැනි කාර්යයන් ගණනාවක් ද වතු හා ග්‍රාමීය යන දෙඅංශය තුළ ක්‍රියාත්මක කෙරින.

1 වන වගුව : 2014 වර්ෂය තුළ යටිතල පහසුකම් සංවර්ධන කටයුතුවල ප්‍රගතිය

| ක්‍රියාත්මක කිරීමේ ආයතනය | සෙවිලි තහඩු ලබාදීම | | ජල සම්පාදන ව්‍යාපෘති | | සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් | | ප්‍රවේශ මාර්ග | | වෙනත් කටයුතු* | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඒකක සංඛ්‍යාව | නිම කළ සංඛ්‍යාව | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ඒකක සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ව්‍යාපෘති / ඒකක සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ක්‍රියාත්මක කළ ව්‍යාපෘති / ඒකක සංඛ්‍යාව | 2014 දී නිමකළ සංඛ්‍යාව |
| වැවිලි මානව සංවර්ධන භාරය | 306 | 306 | 25 | 11 | 1381 | 1170 | 84 | 31 | 148 | 88 | **1944** | **1606** |
| දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මහ නගර සභා සහ ප්‍රාදේශීය සභා | - | - | 32 | 14 | - | - | 156 | 75 | 104 | 25 | **292** | **114** |
| පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 5 | 4 | 2 | 1 | - | - | - | - | 16 | 13 | **23** | **18** |
| **එකතුව** | **311** | **310** | **59** | **26** | **1381** | **1170** | **240** | **106** | **268** | **126** | **2259** | **1738** |

මූලාශ්‍රය: වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය (සංවර්ධන අංශය),
* වෙනත් කටයුතු : ආගමික හා සංස්කෘතික, අධ්‍යාපනික, ක්‍රීඩා සංවර්ධන, පොදු පහසුකම් හා විශේෂ කටයුතු

රූප සටහන 1 :
නල ළිඳ - දික්ඔය වතුයාය



මුළු පිරිවැය ඇස්තමේන්තුව : රු 3,253,324.00
ප්‍රාදේශීය වැවිලි සමාගම (RPC): වටවල
ප්‍රාදේශීය වැවිලි මානව සංවර්ධන භාරය:හැටන්

රූප සටහන 2 :
වැසිකිළි ඉදිකිරීම් රිල්හේන වතුයාය



මුළු පිරිවැය ඇස්තමේන්තුව: රු 40,000.00
ප්‍රාදේශීය වැවිලි සමාගම: කහවත්ත
ප්‍රාදේශීය වැවිලි මානව සංවර්ධන භාරය: රත්නපුර

## 3.2 ග්‍රාමීය ප්‍රදේශවල ජීවනෝපායික හා මූලික පහසුකම් වැඩි දියුණු කිරීම (තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම)

මෙම ක්‍රියා පිළිවෙත යටතේ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන අඩු වරප්‍රසාද සහිත තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම ඉලක්ක කර ගනිමින් වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාවට නංවනු ලැබේ. වතු අංශයේ සිටින රැකියා විරහිත තරුණ පිරිස් කෙරෙහි විශේෂ අවධානය යොමුකරන අතරම, ස්වයං රැකියා සඳහා ණය පහසුකම් සලසා දෙමින් හා නව ශක්ති වැඩසටහන හා වැවිලි අංශයේ ස්වයං රැකියා චක්‍රීය අරමුදල හරහා ඔවුන් මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීම පිණිස ව්‍යවසායකත්ව පුහුණුව ලබා දෙමින්, ස්වයං රැකියා උත්පාදනය කිරීමට එමගින් අපේක්ෂා කෙරේ.

### 3.2.1 ණය පහසුකම් සැපයීම

**2 වන වගුව : ස්වයං රැකියා සඳහා ණය පහසුකම් සැපයීමේ ප්‍රගතිය**

| කාර්ය | වැඩසටහන් හා ව්‍යාපෘති | ප්‍රගතිය |
|---|---|---|
| ස්වයං රැකියා සඳහා ණය පහසුකම් සැපයීම | • නව ශක්ති වැඩසටහන | ප්‍රතිලාභීන් 349 දෙනෙකු අතර රු.මි.16.0 ක් වූ මුදලක් බෙදාහැර ඇත |
| | • වැවිලි අංශයේ ස්වයං රැකියා චක්‍රීය අරමුදල | අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කෙරිණි |

### 3.2.2 තොරතුරු තාක්ෂණය

**3 වන වගුව : තොරතුරු තාක්ෂණ සංවර්ධනයේ ප්‍රගතිය**

| වැඩසටහන් හා ව්‍යාපෘති | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව /ව්‍යාපෘති ගණන | මධ්‍යස්ථාන ගණන |
|---|---|---|
| ප්‍රජා ශක්ති වැඩසටහන<br>▪ පරිගණක පුහුණුව<br>▪ අන්තර්ජාල පහසුකම් සැපයීම | 39,310<br>(2006 සිට 2014 දෙසැම්බර් 31 දක්වා) | 45 |
| නව මධ්‍යස්ථාන පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම | නව මධ්‍යස්ථාන 35 ක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත | |

### 3.2.3 වෘත්තිය පුහුණුව

**4 වන වගුව : තොණ්ඩමාන් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයෙහි ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව**

| කාර්යය | පාඨමාලාව | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව (2014 ජනවාරි - දෙසැම්බර්) |
|---|---|---|
| හැටන්හි පිහිටි තොණ්ඩමාන් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය මෙහෙයවනු ලබන වෘත්තීය පුහුණු කටයුතු | මෝටර් කාර්මික | 31 |
| | විදුලි කාර්මික | 25 |
| | කාර්මික ශිල්පි | 11 |
| | සැලසුම් ශිල්පි | 08 |
| | ඇලුමිනියම් නිමහම්කරු | 30 |
| | දැව ශිල්පි (වඩු කාර්මික) | 09 |
| | පරිගණක යෙදවුම් සහායක | 34 |
| | ඇඳුම් නිර්මාණය | 34 |
| | ගෘහස්ථ විදුලි උපකරණ අලුත්වැඩියාව | 19 |
| | හෝටල් පාඨමාලා | 18 |
| | යතුරු පැදි කාර්මික | 30 |
| | පෑස්සුම් ශිල්පි | 23 |
| | ගුවන් විදුලි /රූපවාහිනී හා ආශ්‍රිත උපකරණ අලුත්වැඩියාව | 3 |
| | **එකතුව** | **275** |

### 3.2.4 ක්‍රීඩා පහසුකම් සැපයීම

ග්‍රාමීය හා නාගරික පෙදෙස්වල වෙසෙන තරුණ පිරිස් ලබන වරප්‍රසාද භුක්ති විඳීමට වතුකරයේ ජීවත්වන තරුණ තරුණියනට හැකියාවක් නොමැත. ඊට හේතු වන්නේ හුදකලාවූ කණ්ඩායම් ලෙස වතු ආශ්‍රිතව වෙසෙන මෙම තරුණ පිරිස් ලබන අඩු අධ්‍යාපනයත්, දේපළවල අයිතිය හා අනෙකුත් පහසුකම් අත්කර ගැනීමේ ඇති අඩු ඉඩකඩත් යන කරුණුය. එබැවින් මෙම තරුණ පිරිස් තුළ උද්ගත විය හැකි අසහනකාරී තත්ත්වයන් සමනය පිණිසත්, ඔවුන්ගේ සුභසාධනය පිණිසත් විවිධ වැඩ සටහන් හා ව්‍යාපෘති ක්‍රියාවට නැංවෙයි. වතු ආශ්‍රිතව එළදායී ශ්‍රමිකයන් හා මූල්‍යමය වශයෙන් සවිමත් තරුණ ප්‍රජාව බිහි කිරීම හා එලදායි ලෙස සිය විවේකය ගත කිරීම සඳහා භෞතික පරිසරයක් ඔවුනට සකස් කරදීම මෙම ව්‍යාපෘති හා වැඩසටහන්වල අපේක්ෂාවයි.

**5 වන වගුව : ක්‍රීඩා වැඩ සටහන් /ව්‍යාපෘති**

| කාර්යය | වැඩසටහන් හා ව්‍යාපෘති | ලියාපදිංචි ශිෂ්‍ය/ක්‍රීඩකයින් සංඛ්‍යාව/ ව්‍යාපෘති ගණන | පුහුණු ශිෂ්‍ය /ක්‍රීඩකයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| ක්‍රීඩා පහසුකම් සැපයීම | තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය<br>▪ අත්පන්දු, පාපන්දු, දැල්පන්දු බැඩ්මින්ටන්, ශාරීරික අභ්‍යාස | 110 | 1000 (පාසල් සිසුන් ඇතුළුව) |
| | ක්‍රීඩා පිට්ටනි ඉදිකිරීම් හා සංවර්ධනය කිරීම<br>• අත්පන්දු, පාපන්දු, හා පැසිපන්දු පිට්ටනි ඉදි කිරීම හා සංවර්ධනය කිරීම<br>• ක්‍රීඩා භාණ්ඩ ලබාදීම | 48 | |

රූප සටහන 3 : ප්‍රාදේශීය වොලිබෝල් පිට්ටනිය-ගාල්ල අරපොළකන්ද



## 3.2.5 තරුණ සමූපකාර සමිති පිහිටුවීම

2014 වර්ෂයේදී ආරම්භ කරන ලද ප්‍රජා ශක්ති තරුණ අභිවෘද්ධි සමූපකාර සමිති එක් මව් සමිතියකින් හා ශාඛා සමිති 44 කින් සමන්විත වේ.

මෙම සමිති පිහිටුවීමේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ තරුණ තරුණියන් අතර ඉතිරිකිරීමේ පුරුද්ද දිරිමත් කිරීමත්, සමූපකාර ප්‍රතිපත්තිය අනුව කටයුතු කරමින් ව්‍යාපාරික කටයුතු සඳහා ණය මුදල් සපයාදීමත්, එහි අද්විතීයභාවය තුළින් සාමාජික සාමාජිකාවන්ගේ ආර්ථික සාමාජීය හා සංස්කෘතික අවශ්‍යතා සපුරාදීමත්, සුභසාධන, සංස්කෘතික, ජීවනෝපායික සංවර්ධන හා සමාජ සංවර්ධන කටයුතු විෂයයෙහි තරුණ තරුණියන්ගේ සහභාගීත්වය දිරිගැන්වීමත් යන කරුණුය.

## 3.2.6 සංස්කෘතික හා ආගමික සහජීවනය සහ අධ්‍යාපන පහසුකම් සැපයීම

පසුගාමී ප්‍රදේශවල ජීවත්වන ජනතාව අතර අධ්‍යාපන පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් දිළිඳු කම පිටුදැකීම මෙහිදී අපේක්ෂා කරනු ලබන අතර, ආගමික හා සංස්කෘතික සහජීවනය ඇති කිරීම තුළින් සදාචාරාත්මකව සංවර්ධනය වූ ජනතාවක් බිහි කිරීම සඳහා අවැසි පහසුකම් සැලසීමද මෙමගින් අපේක්ෂා කෙරේ.

**6 වන වගුව : සංස්කෘතික/ආගමික සහ අධ්‍යාපනික පහසුකම් සැපයීම**

| කාර්යය | පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව /ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|
| තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය - රම්බොඩ | කර්ණාටක සංගීතය, වීණා, මෘදංග, වයලින් හා නැටුම් | 35 |
| ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම | බෞද්ධ හා හින්දු ආගමික මධ්‍යස්ථාන, සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම | 20 |
| පාසල් ගොඩනැගිලි ඉදිකිරීම හා අධ්‍යාපන පහසුකම් සැපයීම (ගොඩනැගිලි හා උපකරණ ලබාදීම) | පාසල් ගොඩනැගිලි ඉදිකිරීම, විද්‍යාගාර ඉදිකිරීම, පන්ති කාමර අලුත්වැඩියා කිරීම, තූර්ය වාදක කණ්ඩායම් සඳහා උපකරණ සැපයීම හා බහු මාධ්‍ය උපකරණ ලබාදීම | 14 |

**රූප සටහන 4: බල්ලකැටුව සංස්කෘතික මධ්‍යස්ථානය**



ප්‍රාදේශීය වැවිලි මානව සංවර්ධන භාරය - බදුල්ල
වටිනාකම: රු. 9,847,429.53

## 3.3 වතු නිවාස වැඩසටහන

"නව ජීවන නිවාස වැඩසටහන" වතු ආශ්‍රිතව පේළි නිවාසවල ජීවත්වන ජනතාව සඳහා තනි නිවාස ලබාදීමට ඇති කරන ලද ව්‍යාපෘතියකි. මෙම වැඩසටහන සඳහා 2014 දී වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 195 ක් වූ අතර වසර අවසානය වන විට එහි වියදම රු.මි. 147.69 ක් වශයෙන් පැවතුණි.

**(අ) වැවිලි මානව සංවර්ධන භාරය - "නව ජීවන නිවාස වැඩසටහන"**

මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභී පවුලක් සඳහා පර්චස් 07 ක ඉඩමක් හිමිවේ. මෙම වැඩසටහන ආරම්භයේදී එක් නිවසක් සඳහා වැය වූ වියදම රු. 440,000 ක් විය. මෙම ණය මුදලින් රු. 200,000 ක් ණය මුදලක් වශයෙන් ලබාදෙන අතර, ඉතිරි රු. 240,000 ප්‍රදානයක් ලෙස පිරිනැමේ. එසේ වුවද මෙම එක් නිවසක ඉදිකිරීමේ පිරිවැය වසර 2012 දී සංශෝධනයට ලක් කෙරුණු අතර, ලබාදුන් ණය මුදල් රු. 275,000 දක්වා ඉහළ නංවන ලදි. ඒ අනුව II වන අදියර යටතේ එක් නිවසක මුළු වියදම රු. 515,000 ක් විය. 2014 වසර තුළ නිවාස 222 ක ඉදිකිරීමේ කටයුතු නිමකර ඇති අතර අනෙක් නිවාසවල ඉදිකිරීම් වැඩ සිදු කෙරෙමින් පවතී

**7 වන වගුව : නව ජීවන නිවාස වැඩසටහන ආශ්‍රිත ප්‍රගතිය**

| අනු අංකය | වැවිලි මානව සංවර්ධන භාරය (ප්‍රාදේශීය මට්ටමින්) | 2014 දී නිමකළ නිවාස ඒකක සංඛ්‍යාව | ක්‍රියාත්මක කෙරෙමින් පවතින (නිවාස ඒකක සංඛ්‍යාව) | 2014 - වියදම (ප්‍රාදේශීය මට්ටමින්) (රු.) |
|---|---|---|---|---|
| 1 | ගාල්ල | 74 | 47 | 55,576,606.00 |
| 2 | රත්නපුරය | - | 65 | 3,106,000.00 |
| 3 | බදුල්ල | 25 | 20 | 5,304,500.00 |
| 4 | කෑගල්ල | - | 118 | 11,796,000.00 |
| 5 | මහනුවර | 51 | 80 | 10,270,300.00 |
| 6 | හැටන් | 22 | 84 | 21,355,810.00 |
| 7 | නුවරඑළිය | 50 | 203 | 39,015,100.00 |
| | | **222** | **617** | **146,424,316.00** |

මූලාශ්‍රය : වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය (සංවර්ධන අංශය)

රූප සටහන 5 : නිවාස ඉදිකිරීම්
ගාල්ල (ප්‍රාදේශීය) - නිව්වැටිල් වතුයාය - ගාල්ල



රූප සටහන 6 : නිවාස ඉදිකිරීම්
මහනුවර (ප්‍රාදේශීය) - ක්වීන්ස්බරි වතුයාය



නිවාස ඒකක 25 - වියදම: රු. 13,390,000.00

## (ආ) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය - ස්වයං උපකාර නිවාස වැඩසටහන සහ විශේෂ ව්‍යාපෘති

වතු නිවාස ව්‍යාපෘතිය 2010 වසරේ අග භාගයේදී පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය වෙත පැවරුණු අතර, ඒ වන විට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ නිවාස 1,248 ක් ඉදිවෙමින් පැවතුණි.

පසුගිය වසරක කාල පරිච්ඡේදය තුළ අභිනව ව්‍යාපෘති කිසිවක් අනුමත කර හෝ ආරම්භ කර නොතිබුණි. මෙම යෝජනා ක්‍රමය යටතේ අරමුදල් සැපයෙනුයේ අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘති කාර්යයන් සඳහා වූ අතර, 2014 වසර අවසානය වන විට නිවාස ඒකක 471 ක ඉදිකිරීමේ කටයුතු අවිච්ඡේදව පැවතුණි.

**8 වන වගුව : ස්වයං උපකාර නිවාස වැඩසටහන ආශ්‍රිත ප්‍රගතිය**

| වර්ෂය | නිමකළ නිවාස ඒකක සංඛ්‍යාව | නිමකළ යුතු නිවාස ඒකක සංඛ්‍යාව |
|---|---|---|
| 2011 | 397 | |
| 2012 | 326 | |
| 2013 | 54 | |
| 2014 | - | 471 |
| **ඒකක** | **777** | **471** |

මූලාශය : වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය (සංවර්ධන අංශය)

## 3.4 2014 දී ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය ප්‍රජා සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘතිවල ප්‍රගතිය

**9 වන වගුව : ග්‍රාමීය ප්‍රජා සංවර්ධන කටයුතුවල ප්‍රධාන කාණ්ඩයන්හි මූල්‍ය ප්‍රගතිය**

| උප ව්‍යාපෘතිය | වැය ශීර්ෂය කේතය | කාණ්ඩය / වැය විෂයයේ නම | මුළු ප්‍රතිපාදනය (රු) | 2014.12.31 දිනට වියදම (රු) | මූල්‍ය ප්‍රගතිය % ක් ලෙස |
|---|---|---|---|---|---|
| 1 | 2502 | ග්‍රාමීය ප්‍රදේශවල ජීවනෝපායික හා මූලික පහසුකම් වැඩිදියුණු කිරීම | 200,000,000.00 | 193,374,907.00 | 96.68 % |
| 2 | 2502 | පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය | 599,500,000.00 | 535,663,594.00 | 89.35 % |
| 16 | 2502 | වතු නිවාස වැඩසටහන | 150,000,000.00 | 147,695,790.00 | 98.46 % |
| | | **මුළු වියදම** | **949,500,000.00** | **876,734,291.00** | **92.34%** |

මූලාශ්‍රය : වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය (ගිණුම් අංශය)

# 4. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනවල ප්‍රගතිය

## 4.1 වැවිලි මානව සංවර්ධන භාරය

### 4.1.1 පසුබිම

වැවිලි මානව සංවර්ධන භාරය වැවිලි අංශයේ වෙසෙන ජනතාවගේ ජීවනෝපාය මාර්ග වැඩිදියුණු කිරීම උදෙසා සමාගමක් ලෙස ප්‍රථමයෙන් “වතු නිවාස හා සමාජ සංවර්ධන භාරය” යනුවෙන් වූ ආයතනයක් නමින් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 1992 සැප්තැම්බර් මස 18 වන දින සංස්ථාපිත කරන ලදි. මෙම ආයතනය පසුව 2002 ඔක්තෝබර් මස 25 වන දින “වැවිලි මානව සංවර්ධන භාරය’’ ලෙස ප්‍රතිනාම ගත කෙරුණි. මේ වන විට මෙම භාරය 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරනු ලැබ තිබේ.

යථෝක්ත ඉලක්ක සාක්සාත් කරගනු පිණිස වැවිලි මානව සංවර්ධන භාරය මගින් පහත දැක්වෙන කටයුතු ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ.

- වතු ප්‍රජාවේ ලයින් කාමර වෙනුවට ස්වයං අයිතිය සතු තනි නිවාස සුදුසු පුද්ගලයන් වෙත ලබාදීම
- පැරණි ලයින් කාමර නිවාස අලුත්වැඩියා කිරීම හා ඒවායේ වහලවල් නැවත සෙවිලි කිරීම
- ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් දියුණු කිරීම
- ළමා සංවර්ධන මධ්‍යස්ථාන හා පරිගණක මධ්‍යස්ථාන (E-kiosk) ස්ථාපිත කිරීම
- ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම - මාර්ග / ගොඩනැගිලි/ ආගමික මධ්‍යස්ථාන යනාදිය

- සෞඛ්‍ය පහසුකම් ලබාදීම හා සමාජ සංවර්ධන කටයුතු
- අලෙවි පහසුකම් සලසා දීම

## 4.1.2 සම්බන්ධිත ආයතන හා සංවිධාන ව්‍යුහය

වැවිලි මානව සංවර්ධන භාරය පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර, මෙය වැවිලි අංශයේ දස ලක්ෂයකට අධික ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම පිණිස වැඩසටහන් සම්බන්ධීකරණය කරමින් ඊට අවශ්‍ය පහසුකම් සලසාදීම උදෙසා ශ්‍රී ලංකා රජය, ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ වතු අංශයේ වෘත්තීය සමිතිවලින් සමන්විත ත්‍රෛයි පාර්ශවික සංවිධානයකි.

වැවිලි මානව සංවර්ධන භාරය වතු කම්කරුවන්ගේ යහපත උදෙසා යටිතල හා සමාජ සංවර්ධන වැඩසටහන් රැසක් මෙහෙයවීමෙහිලා රජයේ අදාළ අමාත්‍යාංශ, වෘත්තීය සමිති, ප්‍රාදේශීය වැවිලි සමාගම්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, වෙනත් දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය හා පුද්ගලික ආයතන සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කරයි.

ශ්‍රී ලංකා රජය, ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ වෘත්තීය සමිති නියෝජිතයන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ වැවිලි මානව සංවර්ධන භාරය ක්‍රියාත්මක වේ. මෙහි කළමනාකරණයේ ප්‍රධානත්වය ගෙන කටයුතු කරනුයේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙකි. අභ්‍යන්තර අධ්‍යක්ෂවරුන්ද, අංශ ප්‍රධානීන් හා බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලයට අනුබද්ධ කාර්ය මණ්ඩලය ද ඔහුට සහාය වේ. ගාල්ල, රත්නපුර, බදුල්ල, කෑගල්ල, මහනුවර, හැටන් සහ නුවරඑළිය යන ස්ථානවල පිහිටි ප්‍රාදේශීය කාර්යාල මගින් ප්‍රධාන කාර්යාලයේ කටයුතු ශක්තිමත් කර ඇත. ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයා අදාළ ප්‍රදේශයේ ප්‍රධානියා වන අතර තාක්ෂණික මූල්‍ය හා කළමනාකරණ කාර්ය මණ්ඩලයට ඔහු සහාය වේ.

## 4.1.3 විශේෂ වැඩ සටහන්

### 4.1.3.1 වතු කම්කරු නිවාස සමූපකාර සමිති

වතු කම්කරු නිවාස සමූපකාර සමිති, සමූපකාර දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව 1993 දී පිහිටුවන ලදි. මූලික වශයෙන් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය වැවිලි සමාගම් මගින් පාලනය වන, වතුයායවල් 435 ආශ්‍රිතව, මෙම සමිති ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකාවේ සාර්ථක ආර්ථික ආකෘතිවලින් එකක් ලෙස දැනට පිළිගෙන ඇති මෙම ප්‍රජා මූල සංවිධාන පසුගිය කාල පරිච්ඡේදය මුළුල්ලේ ක්‍රියාත්මක වූ අතර වතුකරය ආශ්‍රිත ජන සමූහවල දරිද්‍රතාව අවම කිරීම සඳහාත්, ඔවුන්ගේ ජීවන තත්වය නංවාලීම සඳහාත් වැදගත් දායකත්වයක් සලසා දී ඇත.

මෙම සමූපකාර සමිති ජාලය තවදුරටත් වර්ධනය කර පවත්වාගෙන යාම සඳහා නව මූලාරම්භ සහිත පුහුණු වැඩසටහන් රැසක් ද දැනට ක්‍රියාත්මක වේ. ආහාර පිසීම සඳහා දර වෙනුවට ගෑස් භාවිතය, මෙම සමූපකාර සමිති ජාලය ඔස්සේ හඳුන්වාදීම තුළින් වතු ජනතාව

අතර ස්වසන ආශ්‍රිත සෞඛ්‍යමය ආබාධ වැළකී ඇතුවා පමණක් නොව, එමගින් වැඩට පැමිණීමේ ප්‍රගතියක් ද, වන විනාශයේ අඩුවීමක් ද, පරිසර දූෂණයේ හා කාබන් විමෝචනයේ පහත වැටීමක් ද විද්‍යාමාන වී ඇත.

### 4.1.3.2 වතු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වර්ධනය හා ප්‍රගතිය

වතුකර ප්‍රජාවගේ සෞඛ්‍ය තත්වය දියුණු කිරීම සඳහා වැවිලි මානව සංවර්ධන භාරය විසින් ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග මගින් වතු ප්‍රජාවගේ සෞඛ්‍ය තත්ත්වයේ ඇති වූ යහපත් වෙනස්කම් පහත දැක්වෙන වගු ආශ්‍රිත දර්ශක මගින් මනාව පැහැදිලි වේ.

**වතු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දියුණුව පිණිස මෙහෙයවන ලද වැඩසටහන්**

1. 2004/05 කාල පරිච්ජේදය තුළ වතු සෞඛ්‍ය සේවකයන්ගේ හා එහි ජනතාවගේ ප්‍රයෝජනය පිණිස සියලුම ප්‍රධාන වතුයායවල් සඳහා යතුරු පැදි 220 ක් හා ගිලන් රථ 98 ක් බෙදා දෙන ලදි.
2. ප්‍රාදේශීය වැවිලි සමාගම්හි වතුයායවල් ආශ්‍රිතව පෝෂණය හා මව්කිරි දීම පිළිබඳ සුවිශේෂී වැඩසටහන් පවත්වන ලදි.
3. සියලුම ප්‍රාදේශීය වැවිලි සමාගම්හී වතුයායවල් ආශ්‍රිත වතු සෞඛ්‍ය හා සුභසාධන කාර්ය මණ්ඩල සඳහා විශේෂ සෞඛ්‍ය වැඩසටහන් මෙහෙයවන ලදි.
4. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වය වැලැක්වීම අළලා සැකසුනු ව්‍යාපෘති ක්‍රියාවට නංවා ඇත.
5. ඉන්දියානු රජයේ ආධාර මත ළමා සංවර්ධන මධ්‍යස්ථානවල පහසුකම් නැංවීම සඳහා එබඳු මධ්‍යස්ථාන 70 ක් වැඩි දියුණු කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ අවශ්‍ය ලී බඩු හා උපකරණ ද සපයා දෙනු ලැබේ.
6. වැවිලි මානව සංවර්ධන භාරය මගින් ළමා සංවර්ධන නිලධාරීන් පුහුණු කරන අතර, ළමා සංවර්ධනය, පෙර පාසල් අධ්‍යාපනය හා කළමනාකරණය පිළිබඳ ජාතික පාඨමාලාවද මෙහෙයවයි. මේ දක්වා ළමා සංවර්ධන නිලධාරීන් 563 දෙනෙකු පුහුණු කර තිබේ.
7. ළමුන් සහ මව්වරු සඳහා පෝෂණ වැඩසටහන් මෙහෙයවා ඇත .
8. සෞඛ්‍ය හා සමාජ සුභසාධන කටයුතු සම්බන්ධයෙන් වතු වෛද්‍ය සහායකයින් / වතු වෛද්‍ය සුභසාධන නිලධාරීන් පුහුණු කර ඇත.
9. බෝවන හා බෝනොවන රෝග පිළිබඳව වැඩසටහන් මෙහෙයවා ඇත.

## 10 වන වගුව : වතු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වර්ධනය

**10.1 වන වගුව: ආයතනික උපත් ලියාපදිංචි කිරීම්**

| වර්ෂය | ප්‍රතිශතය |
|---|---|
| 1985 | 60.8 |
| 1995 | 89.0 |
| 2000 | 96.0 |
| 2013 | 99.4 |

මූලාශ්‍රය: වැවිලි මානව සංවර්ධන භාරය

**10.2 වන වගුව: මාතෘ මරණ අනුපාතය**

| වර්ෂය | ප්‍රතිශතය |
|---|---|
| 1985 | 23.0 |
| 1995 | 15.0 |
| 2000 | 13.7 |
| 2011 | 2.76 |

මූලාශ්‍රය: වැවිලි මානව සංවර්ධන භාරය

**10.3 වන වගුව: ළදරු මරණ අනුපාතය**

| වර්ෂය | ප්‍රතිශතය |
|---|---|
| 1985 | 49.0 |
| 1995 | 28.0 |
| 2000 | 18.0 |
| 2013 | 10.0 |

මූලාශ්‍රය: වැවිලි මානව සංවර්ධන භාරය

**10.4 වන වගුව: අඩු බර උපත්**

| වර්ෂය | ප්‍රතිශතය |
|---|---|
| 1988 | 20.4 |
| 1998 | 15.3 |
| 2008 | 15.5 |
| 2013 | 20.0 |

මූලාශ්‍රය: වැවිලි මානව සංවර්ධන භාරය

### 4.1.4 පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් සපයන ලද අරමුදල් යටතේ වැවිලි මානව සංවර්ධන භාරය විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

**11 වන වගුව: සංවර්ධන කටයුතුවල මූල්‍ය ප්‍රගතිය (2014.12.31 දින දක්වා)**

| කාණ්ඩය | පිරිවැය ඇස්තමේන්තුව (රු.මි) | වියදම (රු.මි) | % |
|---|---|---|---|
| 2013 වසරේ සිට අඛණ්ඩ වැඩසටහන් | 323.84 | 268.89 | 83% |
| 2014 වසරේ නව වැඩසටහන් | 769.75 | 414.63 | 54% |
| **එකතුව** | **1,093.59** | **683.52** | |

මූලාශ්‍රය : වැවිලි මානව සංවර්ධන භාරය

**12 වන වගුව : 2013 වසරේ අවිච්ඡේද වැඩසටහන් /ව්‍යාපෘති - ප්‍රාදේශීය මට්ටමින් වැවිලි මානව සංවර්ධන භාරයේ ප්‍රගතිය**

| වැවිලි මානව සංවර්ධන භාරයේ ප්‍රදේශීය මධ්‍යස්ථාන | නිවාස ඉදිකිරීම් | | නැවත සෙවිලි කිරීම් | | ජල සම්පාදන ව්‍යාපෘති | | වැසිකිළි | | මාර්ග | | වෙනත් කටයුතු* | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඒකක සංඛ්‍යාව | නිම කළ සංඛ්‍යාව | ඒකක සංඛ්‍යාව | නිම කළ සංඛ්‍යාව | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ඒකක සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ව්‍යාපෘති / ඒකක සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ක්‍රියාත්මක කළ ව්‍යාපෘති / ඒකක සංඛ්‍යාව | 2014 දී නිමකළ සංඛ්‍යාව |
| නුවරඑළිය | 157 | 50 | 144 | 144 | 1 | 1 | 205 | 205 | _ | _ | 3 | 3 | **510** | **403** |
| හැටන් | 66 | 22 | 72 | 72 | _ | _ | 255 | 255 | 1 | 1 | 10 | 10 | **404** | **360** |
| ගාල්ල | 101 | 74 | 33 | 33 | 5 | 2 | 60 | 60 | _ | _ | 3 | 3 | **202** | **172** |
| මහනුවර | 51 | 51 | _ | _ | _ | _ | 150 | 150 | _ | _ | 2 | 2 | **203** | **203** |
| කෑගල්ල | 54 | - | _ | _ | 1 | 1 | 150 | 150 | 2 | 2 | 5 | 4 | **212** | **157** |
| රත්නපුරය | 25 | - | _ | _ | _ | _ | 150 | 150 | 2 | 2 | 3 | 2 | **180** | **154** |
| බදුල්ල | 25 | 25 | _ | _ | _ | _ | 200 | 200 | 2 | 2 | 2 | 2 | **229** | **229** |
| **එකතුව** | **479** | **222** | **249** | **249** | **7** | **4** | **1170** | **1170** | **7** | **7** | **28** | **26** | **1940** | **1678** |

මූලාශ්‍රය: වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය (සංවර්ධන අංශය),
* වෙනත් කටයුතු : ආගමික හා සංස්කෘතික, අධ්‍යාපනික, ක්‍රීඩා සංවර්ධන, පොදු පහසුකම් හා විශේෂ කටයුතු

**13 වන වගුව : 2014 දී අලුතින් අනුමත කළ වැඩසටහන් / ව්‍යාපෘතිවල ප්‍රගතිය**

| වැවිලි මානව සංවර්ධන භාරයේ ප්‍රදේශීය මධ්‍යස්ථාන | නිවාස ඉදිකිරීම් | | නැවත සෙවිලි කිරීම් | | ජල සම්පාදන ව්‍යාපෘති | | වැසිකිළි | | මාර්ග | | වෙනත් කටයුතු* | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඒකක සංඛ්‍යාව | නිම කළ සංඛ්‍යාව | ඒකක සංඛ්‍යාව | නිම කළ සංඛ්‍යාව | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ඒකක සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ව්‍යාපෘති / ඒකක සංඛ්‍යාව | නිමකළ සංඛ්‍යාව | ක්‍රියාත්මක කළ ව්‍යාපෘති / ඒකක සංඛ්‍යාව | 2014 දී නිමකළ සංඛ්‍යාව |
| **නුවරඑළිය** | 96 | - | - | - | 1 | - | 100 | - | 3 | - | 12 | 4 | **212** | **4** |
| **හැටන්** | 40 | - | - | - | 6 | 1 | 100 | - | 4 | 1 | 30 | 10 | **180** | **12** |
| **ගාල්ල** | 20 | - | - | - | 2 | 1 | - | - | - | - | 2 | 1 | **24** | **2** |
| **මහනුවර** | 80 | - | 57 | 57 | 1 | - | 10 | - | 32 | - | 3 | 1 | **183** | **58** |
| **කෑගල්ල** | 64 | - | - | - | 3 | 3 | - | - | 13 | 2 | 15 | 4 | **95** | **9** |
| **රත්නපුරය** | 40 | - | - | - | - | - | - | - | 1 | 1 | 2 | 1 | **43** | **2** |
| **බදුල්ල** | 20 | - | - | - | 5 | 2 | 1 | - | 24 | 20 | 56 | 41 | **106** | **63** |
| **එකතුව** | **360** | **-** | **57** | **57** | **18** | **7** | **211** | - | **77** | **24** | **120** | **62** | 843 | **150** |

මූලාශ්‍රය: වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය (සංවර්ධන අංශය),
* වෙනත් කටයුතු : ආගමික හා සංස්කෘතික, අධ්‍යාපනික, ක්‍රීඩා සංවර්ධන, පොදු පහසුකම් හා විශේෂ කටයුතු